# මාණ්ඩලික සහකාර - පන්තිය I

## ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මාණ්ඩලික සහකාර - පන්ති I සඳහා අයදුම්පත් කැඳවීම

### සුදුසුකම් ලැබීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා

01. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

02. **අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන්, සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි ඇතුළු විෂයයන් 5 ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6 එක් කවරකදී සමත්වී තිබීම.

සහ

අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් විෂයයන් 3 ක් (සාමාන්‍ය ඉංග්‍රීසි, සාමාන්‍ය දැනීම සහ සාමාන්‍ය තොරතුරු තාක්ෂණය හැර) එකවරකදී සමත්වී තිබීම.

අයදුම්කරුවන් තෝරාගැනීමේදී පරිගණක යෙදුම් පිළිබඳ දැනුම සහිත අයදුම්කරුවන් හට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

03. **වයස් සීමාව**

වයස අවුරුදු 28 ට වඩා අඩු විය යුතුය.

**තෝරාගැනීමේ ක්‍රමවේදය**

**ලිඛිත පරීක්ෂණය සහ සම්මුඛ පරීක්ෂණය**

පුවත්පත්වල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයතනික වෙබ් අඩවියේ පළවූ දැන්වීමට ප්‍රතිචාර වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් අතුරින් ඉහත සඳහන් සුදුසුකම් සපුරන අයදුම්කරුවන්, පහත දැක්වෙන ප්‍රශ්න පත්‍ර වලින් සමන්විත ලිඛිත පරීක්ෂණයක් සහ ඉන් පසුව පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගැනේ.

**ප්‍රශ්න පත්‍රය 1** - සංඛ්‍යාත්මක කුසලතාවය සහ බුද්ධි පරීක්ෂණය (පැය 2)

**ප්‍රශ්න පත්‍රය 2** - සාමාන්‍ය දැනීම (පැය 1)

ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**නියමයන් හා කොන්දේසි**

- තෝරාගනු ලබන අයදුම්කරුවන් වසර 2 ක පුහුණු කාලසීමාවක් සඳහා පත් කෙරෙන අතර, මාසික දීමනාවක් (1 වන වසර - රු. 45,000/- සහ 2 වන වසර - රු. 60,000/-) ගෙවනු ලැබේ.
- වසර දෙකක පුහුණු කාලය අවසානයේදී බැංකුවේ පවතින රෙගුලාසි ප්‍රකාරව ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීම සිදු කෙරේ.
- දිස්ත්‍රික් පදනම මත සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගැනේ. එලෙස තෝරාගනු ලබන අයදුම්කරුවන් බැංකුවේ අවශ්‍යතාවය පරිදි දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතු අතර, දෛනික බැංකු කටයුතු සහ බැංකුවේ කළමනාකාරීත්වය විසින් පවරනු ලබන වෙනත් ඕනෑම කාර්යයකට අමතරව POS යන්ත්‍ර භාවිතයෙන් තැන්පතු රැස්කිරීම, ණය අයකරගැනීම සහ අලෙවිකරණ කටයුතු සිදු කළ යුතුය.
- තෝරාගත් අයදුම්කරුවන් පළමුව පත් කරන ලද ස්ථානයේ අවම වශයෙන් වසර 5 ක් සේවය කළ යුතුය. එලෙස වසර 5ක් සේවය කළ පසු ඔවුන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පිහිටි තවත් ශාඛාවකට / අංශයකට මාරු කෙරේ.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් අවශ්‍ය පරිදි සාමාන්‍ය රාජකාරි කාල සීමාවෙන් පසුව හා සති අන්ත / නිවාඩු දින වලද වැඩ කළ යුතුය.

**අයදුම්පත් යොමු කිරීම**

අයදුම්කරුවන් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයතනික වෙබ් අඩවියේ (www.nsb.lk) පළ කර ඇති ආදර්ශ අයදුම්පත භාවිත කළ යුතුවේ. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.08.20 දින හෝ ඊට ප්‍රථම අධිවේගී තැපැලෙන් (Speed Post) හෝ ලියාපදිංචි තැපැලෙන් පහත ලිපිනය වෙත ලැබීමට සලස්වන්න. අයදුම්කරුවන් සිය අයදුම්පත තැපැල් / උප තැපැල් කාර්යාලයට භාරදුන් පසුව ලැබෙන ලදුපත සුරක්ෂිතව තබාගත යුතුය.

අදාළ සහතිකවල පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය. එලෙස සහතිකවල පිටපත් අයදුම්පත සමග අමුණා නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා නොකැඳවේ.

අයදුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

ඉහත සඳහන් කරන ලද ක්‍රමවේද හැර වෙනත් ක්‍රමවේදයක් භාවිතයෙන් අප වෙත යොමු කරනු ලබන අයදුම්පත් කිසිදු පදනමක් මත භාර නොගැනේ.

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරාලීමට අසමත්වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවාගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් සිදු කෙරෙන ඕනෑම ආකාරයක බලපෑමක් හෝ වැරදි තොරතුරු ඉදිරිපත් කිරීමක් මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට නුසුදුසු ලෙස වහාම සැලකීමට හේතු වනු ඇත.

තෝරාගත් අයදුම්කරුවන් පමණක් කැඳවීමේ සහ මෙම බඳවාගැනීම කල් තැබීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන),**
**මානව සම්පත් සංවර්ධන අංශය,**
**ජාතික ඉතිරිකිරීමේ බැංකුව,**
**ප්‍රධාන කාර්යාලය, කොළඹ 03.**

**ඇමතුම් මධ්‍යස්ථානය : 0112379379**
**වෙබ් අඩවිය : www.nsb.lk**

**ඔබේ මුදලට සුරක්ෂිතම ස්ථානය ජාතික ඉතිරිකිරීමේ බැංකුව**